අද රට කරවන රජයට සහ මාධ්‍යවලට සොයා ගත නොහැකි, තේරුම් බේරුම් කරගත නොහැකි, ජනතාවද මුලා කළ හැකි, පොලීසියද අන්දුන් කුන්දුන් කළ හැකි අමුතුම තාලේ භීෂණයක් රටපුරා ව්‍යාප්ත වෙමින් පවතී. ඒ මාධ්‍ය මර්ධනයයි. එය කුමක් සළකුණු කළත් ලකුණු දිය හැකි බහුවරණ ප්‍රශ්නයක් වැනිය.

ලසන්ත වික්‍රමතුංග නැමැති, නාගරික මැද පන්තියේ හා දේශීය හා විදේශීය නියෝජිතයන් හා බුද්ධිමතුන් මෙන්ම ව්‍යාපාරික ප්‍රජාව නියෝජනය කරන ඉංග්‍රීසියෙන් මාධ්‍යකරණයෙහි නියැලෙන මාධ්‍යවේදියා ඝාතනය කිරීම පිළිබඳවත්, රිවිර ඉරිදා සංග්‍රහයෙහි ප්‍රධාන කතෘ උපාලි තෙන්නකෝන් මහතාට පහර දී, බරපතල තුවාල කිරීම පිළිබඳවත් ඇතිවූ තත්වයට කවුරු වගකිව යුතුද යන්න තවමත් නිශ්චිතව සොයා ගැනීමට අපේ පොලීසියට ඇති නොහැකියාව "බහුවරණ" වී ඇත්තේ ඒ නිසාය. පොලීසියේම බිත්තියේ එල්ලා ඇති ප්‍රශ්න පත්‍රයට අනුව නම්,

ලසන්ත ඝාතනය කළේ කවුද?

1. ඔහු විසින් කාලයක් තිස්සේ මාධ්‍ය මගින් ම ගොඩනගා ගත් තරහකරුවන්ය.

2. යුද්ධයට එරෙහි වූ විදේශීය කුමන්ත්‍රණකරුවන් පිරිසක්ය.

3. රජයට පක්ෂ හමුදාවෙන්ම බිහිවූ මහසෝන් කල්ලියයි.

4. යුද්ධය විවේචනය කිරීම නිසා ක්‍රියාන්විතයේ යෙදෙන කිපුණු රණවිරුවන් පිරිසක්ය.

5. ඔහුගේ පෞද්ගලික ජීවිතයේ ප්‍රශ්නයක් නිසාය. (විවාහයන් දෙකක් කරගත් නිසා පවුල් ආරවුල් වැනි ප්‍රශ්නයක් හේතුවෙනි.)

6. කිලිනොච්චි ජයග්‍රහණයත් සමඟ ලසන්ත මහින්ද ළඟට බල්ටියක් ගැසීමේ හේතුවෙන් එයින් කිපුණු එජාප මැරයන් පිරිසක්ය.

7. ලසන්ත ඝාතනය කළේ ලසන්තමය.

මෙම ප්‍රශ්න වැලට පිළිතුරු සැපයීමේදී පක්ෂය අනුවත් යුද්ධය අනුවත් පිළිතුරු වෙනස් විය හැක. එහෙත් අවසානයේදී මෙයට ඉතිරි වන්නේ එක පිළිතුරක් පමණි. පොලිස් පරීක්ෂණ කෙතරම් පැවත්වුවත්, පාරදිගේ පෙළපාලි ගොසින් කෙතරම් බෙරිහන් දුන්නත්, ජාත්‍යන්තර පරීක්ෂණ ඉල්ලා අඬා වැලපුනත්, අන්තිමේදී ඉතිරිවන පිළිතුර ඔබ දන්නවද? එයනම් 7වන පිළිතුරයි. ලසන්ත ඝාතනය වී ඇත්තේ ලසන්තගෙන්ම යන්නයි.

ප්‍රේමදාස සමයේ දසවධ දී මරා දමනු ලැබූ රිචඩ් සොයිසා ගේ ඝාතකයන් සොයා දෙන ලෙස අද බලයේ සිටින එදා විපක්ෂයේ පොදු පෙරමුණේ ඇත්තන් බෙරිහන් දුන්නේ මේ ලෙසටම ය. ඔවුන් එයට රිචඩ්ගේ මව සමඟ ගොස් එදා මෝදර කෝවිලේ ගැසූ පොල් සුණු විසුණු වී යන ලෙසම, ප්‍රේමදාස ජනාධිපතිවරයා සේම, රිචඩ්ගේ ඝාතනය සම්බන්ධයෙන් ඇඟිලි දික් කළ ආරක්ෂක ලොක්කන්ද සුණු විසුණු වී ගියහ. නමුත් එදා විපක්ෂය අද බලයේ සිටියත් තවමත් රිචඩ් සොයිසා ඝාතනය කළේ කවුද යන්න තවමත් සොයාගෙන නැත. එදත් අදත් රට කරවන කෙරවූ දේශපාලඥයන්ට අනුව මේ රිචඩ් මුහුදට පැන දිවි නහගෙන ඇත.

චන්ද්‍රිකා පාලන සමයේ රෝහණ කුමාර නැමැති "සටන" පුවත් පත් කතුවරයා මරා දැම්මේ ප්‍රසිද්ධ මංමාවතකදීය. රූකාන්ත නොමරා මැරුවේය. චන්ද්‍රලේඛාගේ ශරීරයේ මවිල් උගුල්ලා දැම්මාය. අනෝජා වීරසිංහගේ ගෙවල් ගිනිබත් කොට සම්මාන මංකොල්ල කෑහ. ඉක්බාල් ආකාස්ට පහර දුන්නේය. එහෙත් ප්‍රභාකරන්ගේ ඇස්වලට කැටරැක්ස් හැදීගෙන එන බව සොයා ගන්නා දියවැඩියාව නිසා ඇඟිලි පුරුක් නරක් වී ඇති බව සොයා ගන්නා රහස් පොලීසියට රෝහණ කුමාරගේ මිනීමරුවන් සොයා ගැනීමට නොහැකි විය. රූකාන්තගේ අනෝජාගේ සිද්ධිවලට සම්බන්ධ වූවන් දන්නේ නීතියට වඩා දෙයියන් පමණි. ඉක්බාල් අස්තාට පහර දී ඇත්තේ පිටරටින් මෙරටට ආ ආයුධ වෙළෙන්දන්ය. අන්තිමේදී එදා චන්ද්‍රිකා රජය මඟින් සිදු වූ වැරදි මහින්ද විසින් වසාගත්තේ අනෝජාට රජ ගෙදරට කැඳවා වන්දි ලබාදීමෙනි. මාධ්‍යකරුවන් මර්ධනය ගැන ලියනවිට තවත් බොහෝ

**අපේ රටේ සමහර මාධ්‍යවල සදාචාර සම්පන්න කම බිංදුවකි. මෙදා ලසන්ත මෙන්ම එදා වික්ටර් අයිවන් ද චන්ද්‍රිකාව බලයට පත්කර ගැනීමට තම මාධ්‍ය හා තීන්ත පෑන මෙහෙය වූයේය. අන්තිමේදී ඔහු ඒ පෑනෙන්ම චන්ද්‍රිකාට විරුද්ධව වෛර රැජින ලිව්වේය. චන්ද්‍රිකා රජයේ මහ ඇමතිව සිටි මංගල ඇතුළු මැර කල්ලිය දියත් කළ ප්‍රහාර වලින් ඔහු මෙන්ම ලසන්තද බේරුනේ අනූනමයෙනි. මාධ්‍ය විසින් පක්ෂ හා පාට බලයට පත් කරන්නට දරණ වෙහෙස යෙදවිය යුත්තේ ජනතාව වෙනුවෙනි.ජනතාව වෙනුවෙන් සත්‍ය සොයා දෙන සත්‍ය සොයා යන මධ්‍යය සමඟ ජනතාවද සැමදා ජීවත් වේ. ඔවුන් දූෂිත මඩිති ආණ්ඩු පළවා හැර මාධ්‍යකරුවාගෙ ' පෑනට ආදරය කරන්නට පෙළඹෙති.**



මාධ්‍යකරුවන් ගැන ලිවීමට ඇතත් එය සිරසට කිහිපවරක්ම ප්‍රහාර එල්ලවීමේ හේතුවෙනි. මහින්ද රජය යටතේ සිරසට කිහිප වරක්ම තර්ජන එල්ල විය. එයට කිහිප වරක්ම ඇඟිල්ල දිගුවූයේ දුටුගැමුණු පරපුරෙන් උපන් මර්වින් සිල්වාටය. රහසේ අතපය විසිකළ මර්වින් ප්‍රසිද්ධියේ අතපය විසිකිරීමට ගොස් පස්ස බිම උලා ගත්තේය. ඒ රජයේම ආයතනයක් වන රූපවාහිනියට රිංගා "සොත්ති උපාලිකරණය" වීම නිසාය. එදා ගැමුණු සිල්වා කෙල්ලන්ගෙන් ටොකු කෑවේ ඒ නිසාය. නමුත් ඒ විරෝධයට සම්බන්ධ වූ රූපවාහිනියේ සේවය කළ සේවකයන් කිහිපදෙනෙකුට දැලිපිහි පාරවල් එල්ලවිය. නමුත් අදවනතුරුත් ඒ අපරාධකරුවන් පොලිසියට සොයාග ැනීම නොහැකි විය. එහෙත් වන්නියේ සිටින ප්‍රභාකරන් ගේ වකුගඩු අක්‍රියවෙමින් පවතින බව පොලිසිය සොයාගත්තේය.

උපාලි තෙන්නකෝන් මහතාගෙ "තුවාලවීම" සම්බන්ධයෙන් අද කඳුළු වගුරන්නේ එදා රටේ රජ වී සිටි රනිල්ය. රජයට අනුව නම් ලසන්ත මෙන්ම උපාලිද නොඑන ගමන් යවන්නට සැලසුම් කළේ යූ ඇන් පී මැරයන්ය. ඒ යුද්ධය ජයග්‍රහණය නිසා පරාජයේ සෙවනැලි යට අඳුරේ අතපත ගැන යූ ඇන් පී යට නැවතත් ජනතා අනුකම්පා ලබා ගැනීමටය. රජය කළ කිරවා ඡන්ද බලය ලබා ගැනීමටය. යූ ඇන් පීයට අනුව නම් උපාලි කැපුවේ රජයේ මැර හමුදාවයි. උපාලි යුද්ධය විවේචනය කළේ නැත. රිවිර පුවත්පත සමබරව නොගිය ගිය පුවත්පතයි. ඔහු හමුදාවට පක්ෂව නිතරම ලිපි පළ කළේය. එහෙත් රජය මැරයන් ලවා උපාලිව කපා දැම්මේ ලසන්තගේ ඝාතනයෙන් බේරීමටය. "බලන්න අපිට විරුද්ධව ලියූ ලසන්ත විතරක් නොවේ අපිට පක්ෂව ලියන උපාලිවත් කපලා" රජයට දැන් එසේ කිවහැක. යූ ඇන් පී සේම රජයට විරුද්ධ පාක්ෂිකයන්ට එසේ කිව හැක. එහෙත් අපේ රටේ පෙරසිටි නායකයන්ට වඩා මහින්ද නායකයා වාසනාවන්තය. අපේ රටේ පහළ වූ අවාසනාවන්තම ජනාධිපතිවරයා ප්‍රේමදාස වී මහින්ද වාසනාවන්තයා වන්නේ ඇයි, රජයට එන සියළුම ගල් ප්‍රහාර ඔහුට යුද්ධය නැමැති දුහුල් නොවූ ඝන සළුවෙන් වසාගත හැක. අද රටේ කුමක් සිදු වුවත් ඒ සියළු අවාසි විපක්ෂයටද ලබා දීමට තරම් ඔහු වාසනාවන්තය. ඔහු ජනතාව සමඟ නොමැති වුවත් ජනතාව ඔහු සමඟ ඇත. අපේ රටේ මී ළඟට පහළවන යුධ හමුදාපතිවරයා වාසනාවන්ත යුධ හමුදාපතිවරයෙක් යැයි මහින්ද කිසි දිනෙක නොකියන්නේ ඒ නිසාය. ඒ නිසා මෙම ඝාතන හා පහරදීම්වලට සම්බන්ධ කිසිවෙකු අපට කිසිදාක නොකියන්නේ ඒ නිසාය. ඒ නිසා මෙම ඝාතන හා පහරදීම්වලට සම්බන්ධ කිසිවකු අපිට කිසිදාක දකින්නට නොලැබෙනු ඇත. දැක්කත් ඒ ඔහු සම්බන්ධයක් නැති කොහෙන් හෝ පාත් කරනු ලැබූ එකෙක් විය හැක. ඒ නිසා අන්තිමේදී ලසන්ත මැරෙන්නේ ලසන්ත අතින්මය. උපාලි ඇනගත්තේ උපාලිගේ පිහියෙන්මය.

එහෙත් පක්ෂ බලයට පත් කරන්නට වෙහෙසන මාධ්‍යකරුවන්ට මෙය හොඳ පාඩමක් වනු නොඅනුමානය. අපේ රටේ සමහර මාධ්‍යවල සදාචාර සම්පන්න කම බිංදුවකි. මෙදා ලසන්ත මෙන්ම එදා වික්ටර් අයිවන් ද චන්ද්‍රිකාව බලයට පත්කර ගැනීමට තම මාධ්‍ය හා තීන්ත පෑන මෙහෙය වූයේය. අන්තිමේදී ඔහු ඒ පෑනෙන්ම චන්ද්‍රිකාට විරුද්ධව වෛර රැජින ලිව්වේය. චන්ද්‍රිකා රජයේ මහ ඇමතිව සිටි මංගල ඇතුළු මැර කල්ලිය දියත් කළ ප්‍රහාර වලින් ඔහු මෙන්ම ලසන්තද බේරුනේ අනූනමයෙනි. මාධ්‍ය විසින් පක්ෂ හා පාට බලයට පත් කරන්නට දරණ වෙහෙස යෙදවිය යුත්තේ ජනතාව වෙනුවෙනි. ජනතාව වෙනුවෙන් සත්‍ය සොයා දෙන සත්‍ය සොයා යන මධ්‍යය සමඟ ජනතාවද සැමදා ජීවත් වේ. ඔවුන් දූෂිත මඩිති ආණ්ඩු පළවා හැර මාධ්‍යකරුවාගේ පෑනට ආදරය කරන්නට පෙළඹෙති. ඒ සත්‍ය දියට එබූ රබර් බෝලයක් සේම උඩට මතුවෙයි. මා ඉහත වාක්‍ය කණ්ඩ ටික එසේ ලීවේ මෙවැනි රටක ජීවත්වෙන

# කුට්ටම් පොකුණ



නිසාය. ඒ මෙවැනි රටවල්වල මාධ්‍යය හා ජනතාව මිතුරන් නිසාය. ඒ මෙවැනි රටවල්වල මාධ්‍ය හා ජනතාව සිටින්නේ ආණ්ඩුව සමඟ නොව මාධ්‍ය සමඟ නිසාය. ඒ නිසා අපේ රටේ මාධ්‍යකරුවන් වෙනුවෙන් නොකියාම බැරි දෙයක් ජාතක කථා සංග්‍රහයේ එන රාධ ජාතකයෙන් පෙන්නුම් කරයි. එහි එන එක් කොටසක් මම මෙසේ ලියන්නෙමි.

"බමුණා තම ගිරා දරු දෙදෙනා අමතා මෙසේ කීහ. 'මා නැති අතර නුඹලාගේ මව යම් වරදක් නළා නම් ඇයට අවවාද දී වරදින් වළක්වන්න. ඇය සමඟ සැපදුක් සමව බෙදා ගන්න." එහෙත් බමුණා නැති වූ විට බැමිණිය පුරුෂයන් ගෙන්වා අනාචාරයේ හැසිරෙන්නට වූවාය. එය දුටු පොට්ඨපාද ගිරවා අයියා අමතා මෙසේ ඇසීය. අයියණ්ඩි පියා කිව්වේ මවිගේ වරදක් දුටු විට අවවාද කරන්න කියා නේද ? ඇයි නුඹ එසේ නොකරන්නෙ". "මළණුවනි, අතොරක් නැතිව වැරදි කරන ඇයට අවවාද දීමෙන් පළක් නැත. ඒ නිසා නිශ්ශබ්දව සිටින්න" එහෙත් එය නොතැකූ පොට්ඨපාද ගිරවා බැමිණියට අවවාද දුන්නේය. එය පිළිබඳව දැඩි ක්‍රෝධයන් ඇතිකර ගත්

9 වන පිටුවට

ලක්ෂමන් කොඩිතුවක්කු

GATEWAY
LAWYERS

- Advice on Legal Matters
- Business & Commercial
- Conveyancing - Sale or Purchase of Houses, Vacant Land, Units, Flats, Shops, Factories & Farms
- General, Medical or Enduring Powers of Attorney
- Wills & Estate Planning

*Professional, Quality Service Assured*

Senanie Kurukularatne LL.B, Grad Dip.LP
Barrister & Solicitor
Attorney -at- Law - Sri Lanka

Phone : 03 87869682
Fax : 03 87869681
Mobile : 0414 660 513
Email : gateway5@bigpond.net.au
17, Glenview Rise, Berwick, VIC 3806 Austraila